# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1918/8 - 2015 ජුනි මස 09 වැනි අඟහරුවාදා - 2015.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 23(2) වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2015 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2015 අංක 02 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

2. 2013 දෙසැම්බර් මස 05 වන දින අංක 1839/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත, 1990 ජනවාරි මස 05 වන දින අංක 591/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ 16 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම ඡේදයේ (1) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(1) විවෘත විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන පීඨ තිබිය යුතු ය :-

(*අ*) මානව හා සමාජ විද්‍යා පීඨය ;

(*ආ*) ස්වභාවික විද්‍යා පීඨය ;

(*ඇ*) ඉංජිනේරු තාක්ෂණ පීඨය ;

(*ඈ*) අධ්‍යාපන පීඨය ; සහ

(*ඉ*) සෞඛ්‍ය විද්‍යා පීඨය.";




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම ඡේදයේ (6) (7) සහ (8) යන අනුඡේද පිළිවෙලින් (7) (8) සහ (9) වශයෙන් නැවත අංකනය කිරීමෙන් ; සහ

(3) එම ඡේදයේ (5) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන (6) වන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(6) සෞඛ්‍ය විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(i) හෙද ;

(ii) ඖෂධවේද ;

(iii) වෛද්‍ය රසායනාගාර විද්‍යා ;

(iv) මූලික විද්‍යා ;

(v) මනෝ විද්‍යා හා උපදේශන ; සහ

(vi) සෞඛ්‍ය අධ්‍යාපන හා පර්යේෂණ.".

06 - 606

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.